# දඹදෙණි රාජධානිය ආරම්භය

## The beginning of the Dambadeniya Kingdom

මහාචාර්ය ජේ. ඇම්. සුධර්මාවති


## Abstract

The primary objective of this article is to investigate the establishment of the Dambadeniya Kingdom, the factors that contributed to its formation, and the revival of social, cultural, religious, and educational spheres during this era, utilizing both primary and secondary sources.

When examining history, it is evident that the kingdoms of the country have relocated for various reasons, including struggles among royalty, natural disasters, internal conflicts, and foreign invasions. Polonnaruwa, which was the second kingdom of Sri Lanka, collapsed due to the invasion of Kalinga Magha in 1215, which stands out as the mÈt significant reason among many. Consequently, Dambadeniya became the third kingdom. King Vijayabahu III was instrumental in establishing this kingdom. It is located in the Udukaha Basnahira Korale of the Dambadeni Hathpattu in the Kurunegala District of the Northwestern Province, approximately 18 miles southwest of Kurunegala. The primary factor in selecting this location was security, particularly its suitability as a base of operations for future attacks from Magha's forces in Rajarata. Under the leadership of King Vijayabahu III, there was a revival of religious, cultural, and educational pursuits.

**Keywards:** Kalinga Magha, Maya Rata, Polonnaruwa kingdom, Dambadeniya kingdom, King Vijayabahu the third

**හැඳින්වීම**

රටක පාලන මධ්‍යස්ථානයක් ගොඩනැගුණු විට එය එරට දේශපාලන, ආර්ථික, ආගමික හා සංස්කෘතික යන සෑම අංශයක් ම ගොඩනැඟෙන කේන්ද්‍රස්ථානය බවට පත් වේ. මෙරට රාජධානි වරින් වර මාරුවීමේ දී සමකාලීන ව රටේක පැවති දේශපාලන සාධක මුල් වුවා මෙන් ම අගනගර ඉදිකිරීමේ දී ආරක්‍ෂක සහ භූගෝලීය සාධක කෙරෙහි ද රජවරු සිය අවධානය යොමු කර ඇත. ලාංකිකයන්ගේ පළමුවන රාජධානිය වූ උතුරුමැද පළාතේ පිහිටි අනුරාධපුරය, දීර්ඝ කාලයක් පාලන මධ්‍යස්ථානය පැවති අතර විවිධ හේතු නිසා එය අතහැර දැමීමට සිදු විය. පසු ව අනුරාධපුර අවධියේ නගරයක් ලෙස පැවති පොළොන්නරුව දෙවන රාජධානිය ලෙස තෝරා ගැනිණි. සියවස් පහළොවකට අධික කාලයක් මෙම මධ්‍යස්ථාන මුල් කරගෙන පාලන කටයුතු පැවතිණි. මෙරට ඉතිහාසයේ යුගකරණයට අනුව මේ කාලවකවානුව පුරාතන යුගය ලෙස නම් කරන අතරම රජරට ශිෂ්ටාචාරය නමින් ද හැඳින්වේ. තව ද වර්තමානයේ උතුරුමැද පළාතට අයත් මේ ප්‍රදේශ ලාංකිකයන්ගේ සභ්‍යත්වයේ කැඩපත ය. දහතුන්වන සියවස ආරම්භයේ දී ම පොළොන්නරුව රාජධානිය බිඳවැටීමෙන් පසු දීර්ඝ කාලයක් බල කේන්ද්‍රස්ථානය වූ රජරට අතහැර දැමීමට සිදු විය. එතැන් සිට පාලන මධ්‍යස්ථාන වියළි කලාපයෙන් බැහැරව දිවයිනේ තෙත් කලාපයට හෙවත් නිරිතදිගට සංක්‍රමණය වූ ආකාරය දක්නට ලැබේ. එහි දී පළමුවෙන් ම දඹදෙණිය තෝරා ගැනිණි. දඹදෙණියෙන් ආරම්භ වන රාජධානි මාරුවීම යාපහුව, කුරුණෑගල, ගම්පොළ හා කෝට්ටේ දක්වා ගෙන ගොස් ඇත. සියවස් තුනක් පමණ කාලයක ස්ථාන පහක් කරා රාජධානි මාරුවීම සිදු වී ඇති අතර මෙම කාලපරිච්ඡේදය ලංකා ඉතිහාසයේ මධ්‍යතන යුගය ලෙස නම් කෙරේ.

### අගනගරයක ස්වරූපය හඳුනා ගැනීම

ලංකාවේ රාජධානි ගොඩනැඟීමේ පසුබිම ආරම්භ වන්නේ ක්‍රි. පූ. හයවන සියවසේදී පමණ ය. ඒ උතුරු ඉන්දියාවේ සිට පැමිණි විජය ඇතුළු කණ්ඩායමේ සිටි අමාත්‍යවරයෙක් වූ අනුරාධ විසින් මල්වතුඔය ඉවුරුබඩ පිහිටුවාගත් 'අනුරාධග්‍රාමය' පසු කලක දී අනුරාධපුරය බවට පත්වීමෙනි (Mv., VII: 43-44)' ක්‍රි. පූ. හතරවන සියවසේ දී පණ්ඩුකාභය රජතුමා අනුරාධග්‍රාමය 'අනුරාධපුරය' නමින් ස්වකීය අගනුවර බවට පත් කර ගනිමින් එය ක්‍රමානුකූල නගරයක් ලෙස නිර්මාණය කළේ ය. අතීතයේ මෙරට පැවති නගරයක ස්වරූපය හඳුනා ගැනීමට ඉතාමත් සුදුසු ස්ථානය වන්නේ අනුරාධපුරය යි. අනුරාධපුර නගර නිර්මාණය පිළිබඳ ව පැහැදිලි විස්තරයක් මහාවංසයේ දැක්වේ (Mv., X: 83-105). ප්‍රාථමික මූලාශ්‍රය උපකාරි කරගෙන රෝලන්ඩ් සිල්වා මේ නගරය ගැන ඉතා පැහැදිලි වර්ගීකරණයක් කරයි.[1] එතුළින් රාජධානියක තිබිය යුතු අංග හැටියට රජමාළිගය, රාජකීය සංකීර්ණය, ඇතුල්නුවර, පිටිනුවර, විහාරාරාම, ජනාවාස, වැව, දියඅගල ආදිය ගැන දළ අදහසක් ඇති කර ගත හැකි ය. වර්ග සැතපුම් 16ක් පුරා අනුරාධපුරය නගරය විහිදෙයි. ඒ අනුව එකල අගනගර සැලසුම සඳහා විශාල භූමිභාගයක් වෙන් කර ඇති බව පෙනේ. මෙයින් ක්‍රි. පූ. හතරවන සියවසේ නාගරික සැලසුම් පිළිබඳ දළ අදහසක් ලබා දෙයි. මේ නගරය කේන්ද්‍ර කරගෙන මෙරටෙහි දේශපාලන හා පරිපාලන සංවිධාන ගොඩනැගෙමින් සංවිධිත පාලනයක ආරම්භය සිදු විය. අභිෂේකය ලැබීමෙන් පසු පණ්ඩුකාභය රජු විසින් රාජ්‍යයේ පාලනයට තනතුරු ප්‍රදානය කළේය. ඔහුගේ ගුරුවරයා වූ පණ්ඩුල බ්‍රාහ්මණයාගේ පුත් චන්ද්‍රට පෙරෙවි තනතුර, සෙසු භටයන්ට ද සුදුසු පරිද්දෙන් තනතුරු දීම, සිය දෙටු මාමණ්ඩිය වූ අභයරාජ හට රත්තිරාජ (රෑ රජය) හෙවත් නගරගුත්තික තනතුර ද දුන්නේය.[2] කල්ගතවනවිට අනුරාධපුරයේ සිහසුන් දැරූ ඇතැම් පාලකයෝ[3] නගර සැලසුමේ විවිධ වර්ධනයන් බුදුදහම ලැබීමත් සමඟ සිදු කරමින් මනා ලෙස සංවිධානය වූ රාජ්‍ය පාලන ක්‍රමයක් ගොඩනැගීමට කටයුතු කළහ. ලංකාවේ අගනගර ස්වරූපය දේශපාලන (පාලන න්‍යෂ්ටිය)

හා ආගමික බලය සංකේන්ද්‍රගත කරන ලද ලක්ෂණවලින් යුක්ත බව අනුරාධපුරය ඇතුළු අනෙක් අගනගර විමර්ශනය කිරීමෙන් පැහැදිලි වේ.

## දඹදෙණි රාජධානිය පිහිටුවා ගැනීමේ පසුබිම

ක්‍රි. ව. එකොළොස්වන සියවසේ දී එල්ල වූ දකුණු ඉන්දියානු චෝළ ආක්‍රමණ නිසා අනුරාධපුර රාජධානිය බිඳවැටිණි. චෝළයෝ අනුරාධපුර අතහැර පොළොන්නරුව සිය පාලන මධ්‍යස්ථානය කරගෙන ලංකාවේ උතුරු ප්‍රදේශය මුම්මුඩිචෝළමණ්ඩලම් යනුවෙන් නම් කරගෙන ඔවුන්ගේ පාලන ඒකකයක් වශයෙන් පවත්වා ගෙන ගියහ.[4] වසර හැත්තෑහතක් පමණ දීර්ඝ කාලයක් පැවති චෝළ පාලනයෙන් දිවයින මුදවා ගැනීමට සමත් වූ පළමුවන විජයබාහු රජතුමා (1055 - 1110) නව අගනුවර වශයෙන් පොළොන්නරුව තෝරා ගත්තේ ය.[5] මෙතැන් සිට වසර 150 පමණ කාලයක් පැවති අගනුවර මෙම කාලය තුළ වර්ධනය වූ විවිධ හේතු[6] මෙන් ම ආසන්න අවධියේ දී එල්ල වූ කාලිංග මාඝගේ ආක්‍රමණයත් සමඟ ක්‍රි. ව. 1215දී බිඳවැටිණි. කාලිංග මාඝගේ ආක්‍රමණය ජනතාව අතිශයින් පීඩාවට ලක් කළ ඉතා දරුණු එකක් වූ බව මහාවංසයේ එන තොරතුරු මගින් අනාවරණ වේ.[7] මේ ව්‍යසනය හමුවේ මහා සංඝයා ද ජනප්‍රධානීහු ද රජ පවුල්වලට අයත් කුමාරවරු ද සෙසු ජනයා ද රජරට ගම් නගර හැර දමා වනදුර්ග ගිරිදුර්ග සොයා ගිය අතර[8] ඇතැම් භික්ෂූහු දිවයින අතහැර දමා දකුණු ඉන්දියාවේ චෝළ පාණ්ඩ්‍ය රටවල් කරා සංක්‍රමණය වූය.[9] මාඝ සහ ඔහුගේ සේනාව එවක රජ කළ පරාක්‍රම පාණ්ඩ්‍ය අල්ලා ගෙන ජීවිතක්ෂයට පත් කර පොළොන්නරුවට පහර දී අල්ලා ගැනිමත් සමඟ[10] රජරට මාඝ ආධිපත්‍යයට නතු විය. එමෙන් ම මාඝ අවුරුදු හතළිහක් වැනි දීර්ඝ කාලයක් රජරට සිටි කාලයේ[11] රජරටට සීමාවෙමින් උතුරු, වයඹ හා ඊසානදිග ඇතුළත් වෙන අන්දමින් සේනා සන්නද්ධ කළ බලකොටු පිහිටුවා ගනිමින් ස්වකීය බලය ශක්තිමත් කර ගත්තේය.[12] මේ තත්ත්වය යටතේ ලාංකිකයන්ට පාලකයෙක් නොමැතිවීමෙන් රට අරාජික තත්ත්වයට පත්වීම වැළැක්වීමට කිසිවෙකුට නොහැකි විණි.

එහි එක් ප්‍රතිඵලයක් වූයේ රුහුණු මායා දෙරටෙහි ප්‍රාදේශීය මට්ටමේ නායකයන් බිහිවීම ය. එහි ස්වරූපය මහාවංස කතුවරයා විස්තර කරන්නේ "ඒ රාජාන්තරයෙහි මහඟු පින්වත් බොහෝ වූ ඇතැම් ජනකෙනෙක් ඒ ඒ මහාදුර්ග පර්වතයන්හි මනහර නගර ග්‍රාමයන් කරවා ඒ ඒ තැන වාසය කරන්නෝ ලෝකය ද ශාසනය ද නිරවුල් කොට පාලනය කළෝය. යනුවෙනි.[13] යාපහුවේ විසූ ශුභ සෙනෙවි, මණිමේඛල රට ගංගාද්‍රෝණි පර්වතයෙහි වාසය කළ සංඛ සෙනෙවි හා රුහුණු රට ගෝවින්දහෙල විසූ ආදිපාද භුවනෙකබාහු යන පිරිස එවැනි නායකත්වය ගෙන තම තමන්ගේ බල ප්‍රදේශයන්හි ආධිපත්‍යය රැකගැනීම සඳහා මහත් පරිශ්‍රමයක යෙදී සිටි බව මහාවංසයේ සඳහන් විස්තරයෙන් පැහැදිලි කරයි.[14]

මීට අමතර ව මෙහි තවත් ප්‍රතිඵලයක් වූයේ මෙතෙක් ලක්දිව නොපැවතුණු ආකාරයේ වන්නි නමින් හැඳින්වුණ ප්‍රාදේශීය මට්ටමේ ම පාලකයන් පිරිසක් ඇතිවීම ය. මේ අය වන්නි රාජ නමින් මහාවංසයේ දක්වයි.[15] වන්නි රාජ හෙවත් වන්නි නිරිඳු නමින් හැඳින්වෙන මේ පිරිස වනගත ප්‍රදේශයක ආධිපත්‍යය පිහිටුවා ගත් ප්‍රාදේශීය නායයන් ලෙස සැලකේ.[16] විදේශ ආක්‍රමණිකයෙක් උතුරු ප්‍රදේශයේ බලවත් අන්දමින් ක්‍රියා කරන කාලයක රුහුණු, මායා දෙරටේ සීමාසහිත ප්‍රදේශයන්හි පමණක් ආරක්‍ෂාව පවත්වාගෙන යන ප්‍රදේශීය නායකයන් අතරින් වන්නි රජෙක්ව සිටි තුන්වන විජයබාහු රජතුමා බොහෝ දුක්ගැහැට විඳිමින් මායාරට එක්සේසත් කරගනිමින් දඹදෙණිය සිය පාලන මධ්‍යස්ථානය බවට පත් කර ගැනීමත් සමඟ දඹදෙණිය මෙරට පාලන මධ්‍යස්ථානය බවට පත් විය. මාඝගේ ව්‍යසනයෙහි තවත් ප්‍රතිඵලයක් වූයේ කාලයාගේ ඇවෑමෙන් මාඝට එරෙහි ව සංවිධානය වීම සඳහා සිංහල නායකත්වයක් ඇතිවීම හා රාජධානි නිරිතදිගට සංක්‍රමණය වීම ය.

## තුන්වන විජයබාහු රජතුමා (ක්‍රි. ව. 1232-1236)

දඹදෙණිය රාජධානියේ පළමුවන පාලකයා වූ තුන්වන විජයබාහු රජතුමා මෙරට දේශපාලන ඉතිහාසයේ නව සන්ධියක්

ඇති කිරීමේ පුරෝගාමියා ය. මාඝ සිදු කළ ව්‍යසනයෙන් අරාජික වූ රට මුදවා ගැනීමේ දුෂ්කර කර්තව්‍යයට නිසි පියවර ගැනීමට තුන්වන විජයබාහු රජතුමා සමත් විය. ඒ ගමනේ පළමු අවස්ථාව වන්නි රජෙකු ලෙස කටයුතු කරමින් ප්‍රාදේශීය නායකත්වයක් ගොඩනඟා ගැනීම ය. ඒ වන විට සිටි අනෙක් ප්‍රාදේශීය නායකයන් අභිබවමින් පෙරමුණ ගනිමින් මායා රටෙහි පාලකයා බවට පත් විය. එසේ ම රජතුමා මහලු වියේ දී මායා රටේ පාලකයා වී ඇති බව ද පෙන්නුම් කෙරේ. මෙම තොරතුරු ගැන මහාවංසයේ විස්තරය වන්නේ "රජතෙම පසමිතුරු බියෙන් ඒ ඒ මහවනයට දුර්ගයට පිවිස බෝකල් වැස වන්නි රජබවට පැමිණියේ සියලු ම සිංහලාමාත්‍යයන් තමන් වසඟකොට මහ බලැත්තේ සිංහල සේනාව සමඟ නික්ම මහාතේජස්කන්දයක් අඳුරු සෙයින් යුද පිණිස සැදුනු චතුරඟ සමන්විත වූ සියලු පසමිතුරු සෙන් වැනසුයේය. කැමැති පරිද්දෙන් ගමෙක් ගමෙක්හි ගෙයක් ගෙයක් පාසා වාසය කරන්නා වූ සියලුම ද්‍රවිඩ යෝධයන් ඒ ඒ තැනින් පලවාපිය. ඒ ප්‍රධාන මායාරට සතුරු කටු පහකොට එහි අතිශයින් උස් වූ දඹදෙණි මතුයෙහි මනරම් පවුරු වාසල් යුක්ත වූ රම්‍ය වූ පුරයක් කරවා එහි සැපයේ වෙසෙමින් පණ්ඩිත වූ ඒ මහිපතිතෙම රජ කෙළේය."[17] රජතුමා මුහුණදුන් මෙම පසුබිම පූජාවලියේ දක්වන්නේ "මායා රජයේ හිඳ වැඩි අන්ධකාරයෙහි තේජෝ කඳක් සේ පැනනැගී සිංහල බල පිරිස් ගෙන දෙමළ භයින් ඒ ඒ තන්හි මහවන්නිව වසන බලි සිංහලයන් තමහට වසඟයෙන් ගෙන අවසඟයන් සාධාගත්"[18] යනුවෙනි. මූලාශ්‍රය පෙන්නුම් කෙරෙන විස්තරයෙන් රජු පැමිණි මේ දුෂ්කර ගමන පිළිබඳ පැහැදිලි චිත්‍රයක් මවා ගත හැකි වේ.

තුන්වන විජයබාහු රජතුමා සිදු කළ වැදගත් කාර්යයක් වූයේ කොත්මලේ සඟවා තිබූ දන්ත ධාතුව හා පාත්‍රා ධාතුව ලබා ගැනීම හා ධාතූන් වහන්සේලාගේ ආරක්ෂාව උදෙසා බෙලිගල දළදා මැදුරක් ඉදි කරවා එහි ධාතූන් තැන්පත් කිරීම යි.[19] එය මායා රටේ රජුගේ ආධිපත්‍යය ශක්තිමත්වීමට ද හේතුවක් විය. එමෙන් ම රජතුමාට සංඝරක්ඛිත හා මේධංකර යන මහාතෙරවරුන්ගේ සහයෝගය ද හිමි විය. පරිහානියට පත් වෙමින් පැවති සඟ

සසුන නඟාසිටුවීම, භික්ෂූන්ගේ ධර්ම ශාස්ත්‍රීය ඥානාභිවර්ධනයට කටයුතු කිරීම, දඹදෙණියේ විජයසුන්දරාරාමය ඉදිකිරීම හා ජරාවාස වූ වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය ආදි ආගමික කටයුතු රැසක් ම ඉටු කිරීමට ද රජතුමාට හැකි විය.[20] රට පත් ව තිබූ විලෝපනයෙන් ගොඩ ගැනීමට තුන්වන විජයබාහු රජතුමා දඹදෙණිය මුල් කරගනිමින් ඉටු කළ මෙහෙවර අතිශයෙන් ම වැදගත් ය.

## දඹදෙණිය රාජධානිය ලෙස පිහිටුවා ගැනීම

දඹදෙණිය රාජධානිය ලෙස පිහිටුවා ගැනීම සම්බන්ධයෙන් ප්‍රාථමික මූලාශ්‍රය දක්වා ඇති තොරතුරු අනුව යමින් ලියනගමගේ දක්වන්නේ “මායා රටේ අධිපතියා බවට පත් වූ විජයබාහු රජතුමා කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙණි හත්පත්තුවේ උඩුකහ බස්නාහිර කෝරළේ, කුරුණෑගලට සැතපුම් 18ක් නිරිත දිගින් පිහිටි දඹදෙණියෙහි ස්වකීය අගනුවර පිහිටුවා ගත්තේය”[21] යනුවෙනි. එමෙන් ම දඹදෙණිය පිහිටියේ මාඝ රජුගේ ආධිපත්‍යය යටතේ පැවති පොළොන්නරුවට සැතපුම් හැත්තෑපහක් පමණ ඈතිනි.[22] මහාවංසයෙහි “ඒ ප්‍රධාන මායාරට සතුරු කටු පහ කොට එහි අතිශයින් උස් වූ දඹදෙණි පව් මතුයෙහි මනරම් පවුරු වාසල් යුක්තවූ රම්‍යවූ පුරයක් කරවා”[23] යනුවෙන් දැක්වෙන හෙයින් රජතුමා විසින් තම අවශ්‍යතාව අනුව තෝරාගත් මධ්‍යස්ථානය ස්වභාවධර්මයෙන් ලැබුණු රැකවරණය තවදුරටත් ශක්තිමත් කර ගැනීමට කටයුතු කර ඇති බව පැහැදිලි වේ. ඒ වන විටත් රටේ පැවති අස්ථාවර දේශපාලන තත්ත්වයට මුහුණදීමට ආරක්ෂාව ප්‍රධාන කරුණ බවට පත් වීම මෙම ස්ථානය තෝරා ගැනීමට හේතු විය. යම් ආකාරයකින් සතුරු ආක්‍රමණයක් එල්ල වුවහොත් යුද්ධ මූලස්ථානයක් වශයෙන් යොදා ගෙන ප්‍රතිප්‍රහාර එල්ල කරමින් ආරක්ෂාවීමට ඇති හැකියාව මෙහි දී සැළකිල්ලට ගෙන ඇත.[24]

දඹදෙණියේ ඇති නටඹුන් පරීක්ෂා කිරීමෙන් රාජධානිය පිහිටුවා ගැනීමේ වැදගත්කම හා රාජධානියක් ලෙස පවත්වා ගෙන

ගොස් ඇති ආකාරය මනාව පැහැදිලි වේ. පොළොව මට්ටමේ සිට අඩි 400 පමණ උසකින් යුක්ත කිලෝ මීටර් දෙකක පමණ වටප්‍රමාණයකින් සමන්විත වූ තැනිතලා භූමියකින් උසට නැගී ඇති දඹදෙණි පර්වතය මුල් කරගෙන රාජධානිය ගොඩනගා තිබේ. ප්‍රාකාර ස්වරූපයක් ගත් මාළිගාගල නමින් හැඳින්වෙන මේ කඳුවැටියට නැඟීමට නැගෙනහිර දෙසින් පිහිටි පෙළොව ම උපකාරි කරගෙන පඩි පෙළක් සකස් කර ඇත. මේ නිසා පඩිපෙලෙහි ඒකාකාරි ස්වරූපයක් නොමැත. මාලක දෙකකින් යුත් කඳුවැටියේ පළමු මාලකයට පඩි 256 ක් නැඟිය යුතු ය. මේ භූමිය පුරාම නටබුන් විසිර පවති. ඒ අතුරින් ගොඩනැගිල්ලක පාදමක් හා පොකුණු (රත්මල් පොකුණ. මාවී පොකුණ, කිතුල්ලහ පොකුණ) කිහිපයක් දැකිය හැකි ය. දෙවන මාළකය හෙවත් කන්ද මුදුනට නැඟීමට පිහිටි ගලෙහිම සකස් කරන ලද පඩි පෙලකි. ගල මුදුනෙහි ද ගොඩනැගිල්ලක් තිබූ බවට සලකුණු ඇත. ගල මුදුන අවට ප්‍රදේශය තරමක් දුරට යන තෙක් ම පැහැදිලිව දැක ගත හැකි ය. මේ ස්ථානව පිළිබඳ මහාචාර්ය ගුණවර්ධනගේ අදහස වන්නේ පර්වතය මුදුනේ ස්වභාවික පිහිටීම හා එහි භූ දර්ශනය සීගිරිය පර්වත මුදුන හා සාදෘශ්‍ය බවත් විශේෂයෙන් ම දඹදෙණිය පර්වතය මුදුනට නැඟීමට අති සෝපාන පේළි හා භූ දර්ශනය සීගිරියේ මාලක උද්‍යානය සිහි ගන්වන බවත් ය.[25]

දඹදෙණි අස්නේ රාජධානිය ගැන සඳහන් කරන විස්තරය අනුව එය ඇතුළු නුවර හා පිටි නුවර ලෙස සකස් කර තිබේ.[26] ඇතුල් නුවර ඉදිකළ ගොඩනැගිලි ලෙස දළදා මාළිගාව, රජ මාළිගාව, මුර ගෙවල්, ගබඩා ගෙවල්, බිසෝ ගෙවල් හා පොකුණු හයක් ගැන කියවේ. පිටි නුවර ගැන ද දක්වන විස්තරය වන්නේ "ගල් පහුරින් මැටි පහුරින් හා දඬු පහුරින් යුත් කෝට්ටකයෙන් වට වුණු සෙට්ටි වීදිය, අගම්පඬි වීදිය හා පරිවාර වීදිය සහිත පිටි නුවර"[27] යනුවෙනි. දැනට විසිර පවත්නා නටබුන් අතර ඇති ගල් බැම් හා පස් කණ්ඩි ඇතුළු නුවර හා පිටිර නුවර වට කර පැවති ආරක්ෂක පවුරු දෙකේ ඒවා බව හඳුනා ගැනීමට හැකි ය. ඇතුළු නුවර ප්‍රාකාරය දඹදෙණි ගලවටා ගොස් කත්ගලට සම්බන්ධ කර තිබිණි. ඒ අනුව ඇතුලු නුවර භූමි ප්‍රමාණයෙන් අඩු

සීමාවක ඇත. එහෙත් පිට නුවර ඊට වඩා ප්‍රමාණයෙන් විශාල භූමියක් ඇතුළත් වන බව ද පෙනේ.[28] මේ අනුව භූ විෂමතාවට අනුකූල වන පරිදි ආරක්ෂාව පදනම් කරගෙන ඉදි කර ඇති රාජධානිය පිළිබඳ ව සාහිත්‍ය මූලාශ්‍රය ගෙනෙන තොරතුරු පුරා විද්‍යාත්මක දත්තවලින් ද තහවුරු වේ. අගනගරයක තිබිය යුතු අංගයන්ගෙන් දඹදෙණියේ අගනුවර ඉදිකර ඇති බව මෙම විස්තරවලින් පැහැදිලි වේ.

වර්තමානය වන විට දඹදෙණිය රාජධානියට ඇතුළත් වන්නා වූ භූමි ප්‍රමාණය වෙනස්කම්වලට භාජනය වී ඇත. ඒ මේ කන්ද පාමුල භූමිය ජනාවාසව පවතින හෙයින් නිවාස හා කුඹුරු මේ වටා පිහිටා ඇත. එමෙන් ම පිටිනුවරට ඇතුළත් ප්‍රදේශයේ වර්මානයේ දඹදෙණි නගරය පිහිටා ඇත. මේ නිසා පුරාවස්තු ආරක්ෂා කිරීම බෙහෙවින් ම අපහසු කාර්යයක්ව පවති. මිනිස් ක්‍රියාකාරකම් නිසා පුරා වස්තූන්ට හානි සිදු වී ඇත. උදාහරණ ලෙස ඔපමට්ටම් කරන කළු ගල් යොදාගෙන ඉදි කර තිබෙන 'කමත' පෙන්වා දිය හැකි ය. තත්කාලීනව මෙරට පැවති ව්‍යාකූල දේශපාලන පසුබිම තුළ මෙවැනි රාජධානියක් ගොඩනගා ගැනීම තුන්වන විජයබාහු රජතුමා සමත්වීම විශිෂ්ට ජයග්‍රහණයකි.

## දඹදෙණිය රාජධානියක් වශයෙන් තෝරා ගැනීමේ වැදගත්කම

රජරට දේශපාලන නායකත්වයෙන් ගිලිහීයත් ම මායාරට දේශපාලන වශයෙන් ප්‍රධාන කලාපය බවට පත් වීය. එමෙන් ම රාජධානි නිරිතදිගට හෙවත් තෙත් කලාපයට මාරුවීමේ ආරම්භ ද සිදු විය. මෙරට ඉදිරි දේශපාලන ගමන් මාර්ගයේ හැරවුම් ලක්ෂය බවට දඹදෙණිය පත් විය. ඒ තුන්වන විජයබාහු රජතුමා නායකත්වයට පත් වීම හේතුවෙනි. තුන්වන විජයබාහු රජතුමාගේ වැඩිමල් පුත් දෙවන පරාක්‍රමබාහු රජතුමාට මාඝ පළවා හැරීමටත් චන්ද්‍රභානුගේ ආක්‍රමණ දෙකම පරාජය කිරීමටත් පාණ්ඩ්‍ය ආක්‍රමණ වළක්වා ගැනීමටත් එම ආක්‍රමණවලට සාර්ථකව මුහුණදීමේ සඳහාත් සුදුසු වාතාවරණය ගොඩනැගෙන්නේ දඹදෙණිය රාජධානියක් ලෙස ඉදි කෙරුණු හෙයිනි. පරිහානිය කරා යමින්

තිබූ මෙරට දේශපාලන තන්ත්‍රය යළි ගොඩනැංවීමට දඹදෙණිය රාජධානිය බවට පත් කර ගැනීම හේතු වී ඇත.

දන්ත ධාතූන් වහන්සේ හා පාත්‍ර ධාතූන් වහන්සේලා රැක ගැනීම, තැන තැන විසිර සිටි භික්ෂූන් වහන්සේලා කැඳවා ගැනීම, සංඝ සම්මේලනයක් සිදු කර භික්ෂූන්ගේ පිරිහී පැවති විනය හා වත්පිළිවෙත් ප්‍රතිෂ්ඨාපනය කිරීම, භික්ෂු අධ්‍යාපනය දියුණු කිරීම, ධර්ම ග්‍රන්ථ රචනා කරවීම, දින හතක් පුරා ම උපසම්පදාව පැවැත්වීම යන වැදගත් කාර්යයන් ඉටු කරමින් බුදු සසුන පවත්වා ගෙන යෑමට තුන්වන විජයබාහු රජතුමා දරූ උත්සාහය පශ්චාත් කාලීනව සසුනේ වර්ධනයට ඉමහත් අන්දමින් බලපෑවේ ය.

අවුරුදු හතරක් වැනි කෙටි රාජ්‍ය කාලය තුළ එතුමා මායාරටේ සාමය හා ස්ථාවරබව ගොඩනැංවීමට සමත් වූ හෙයින් එම පසුබිම ඔහු පුත් දෙවන පරාක්‍රමබාහු රජුගේ රාජසමයේ සාර්ථක බවට හේතු විය. එබැවින් දෙවන පරාක්‍රමබාහු රජතුමාට අභ්‍යන්තර වශයෙන් පැවති ප්‍රාදේශීය දේශපාලන වාතාවරණය මෙන් ම අඩ සියවසකට ආසන්න කාලයක් පර සතුරන්ට යටත්ව පැවති රජරට නිදහස් කර ගැනීම හා පසු ව එල්ල වූ විදේශ ආක්‍රමණවලින් ද රට මුදවා ගනිමින් බෞද්ධාගමේ ප්‍රබෝධයක් ඇති කිරීමටත් ශාස්ත්‍රීය දියුණුවක් ඇති කිරීමටත් ආර්ථික තත්ත්වය නඟාලීමටත් හැකි විය.

## නිගමනය

රජරට සේනා සන්නද්ධ ව මාඝ රැඳී සිටියදී තුන්වන විජයබාහු රජතුමා දැඩි උත්සාහයක නිරත වෙමින් මායාරට එක්සත් කර ගනිමින් දඹදෙණිය පාලන මධ්‍යස්ථානය බවට පත් කර ගැනීමට සමත් විය. මාඝගේ පීඩාවන්ට ලක්ව අසරණව සිටි රජරට වැසියන්ට මෙන් ම භික්ෂු සංඝයාට ද මෙසේ මායාරට ක්ෂේමභූමියක් බවට පත් විය. එමෙන් ම මේ වන විට රටේ පැවති දේශපාලන වාතාවරණය හා පසු ව ඇති වූ පරසතුරු උවදුරු ජයගෙන යළි දිවයිනේ ස්වාධිපත්‍යය ළඟා කරගැනීමට දඹදෙණිය යුධමය මූලස්ථානයක් වගේ ම ආරක්ෂක ස්ථානයක් ලෙස

පවත්වාගෙන යෑමට ද හැකි විය. ශාසනික පරිහානිය වළක්වාලීම ද එතුමාගේ කාර්භාරයක් සේ සැලකූ බව පැහැදිලි ය. තුන්වන විජයබාහු රජතුමා ආර්ථික කටයුතු සම්බන්ධයෙන් අවධානය යොමු කළ බවට තොරතුරු සඳහන් නොවුණ ද දඹදෙණිය මුල් කරගෙන රාජකීය වාසස්ථානයක් බවට පත් කරගෙන ගොඩනැගූ දේශපාලන නායකත්වය හා එතුළින් ඇති කිරීමට හැකි වූ ආගමික පුනර්ජීවනය හා ශාස්ත්‍රීය සේවය ලාංකිකයන්ගේ අනාගත අභිවෘද්ධියට සෘජුව ම බලපෑ බව නිගමනය කළ හැකි ය.

## ආන්තික සටහන්

1. Development of the ancient cities in Sri Lanka, 2000, Roland Silva, 53,54 මාලිගා ප්‍රදේශය, දේවාල, නගරයේ දොරටු සතර හා නගරය වට කළ බැම්ම, වෙළෙඳ සැල්, රෝහල්, සුසාන භූමි දෙක, වෙළෙඳ නිවාස, කෘෂිකාර්මික නිවාස (අභයවාපි, ගමිණිවාපි, ජයවාපි, නුවරවැව, පුලියන්කුලම්), දඩයම් කරුවන්ගේ නිවාස, ආගමික වාසස්ථාන (ජෝතිය, ගිරි, ආජීවක, කාලවේල හා චිත්තරාජ, කසල බැහැර කිරීමේ ස්ථාන, නාගරික ජල සැපයුම (ජයවාපි, අභයවාපි, ගාමිණිවාපි)
2. Mv.,X:78-81. නගරගුත්තික තනතුර, මෑණියන්ට ද තමන්ටද උපකාර කළහෙයින් දෙටුමයිල් අභයරාජ නොමරා ඔහුට රජය දුන්නේය.ඒ තෙම නුවර රක්නේ විය.එතැන්පටන් නුවර නගරගුත්තිකයෝ වූහ.
3. දේවානම්පියතිස්ස රජතුමා, (Mv.,Xv:182-191; Mv.,XIX:39-43), දුටුගැමුණු රජතුමා, (Mv.,XXVI:6-18) වළගම්බා රජතුමා: Mv., Xxxiii:80-103).
4. Cv.,LIV: 13- 22.
5. Cv.,LVIII, LIX: 1 – 11.
6. ලියනගමගේ, 1989: 56 – 119.
7. Cv.,LXXX, 54 – 80.
8. හත්ථවනගල්ල විහාරවංස, 1909: 30.
9. Cv.,LXXX1, 21, 22.
10. Cv.,LXXX, 70 – 73.
11. පූජාවලිය,

12. Cv.,LXXXIII, 15 – 18 (පුළත්ථිපුර, කොට්ඨසාරගාම, ගඩගාතලාක, කාකාලයගාම, පදීරට්ඨ, කුරුන්දි, මානාමත්ත, මහාතිත්ථ, මන්නාරපට්ටන. පුළච්චේරිතිතිථ, වාලිකාගාම, ගොනරට්ඨ, ගොනුසුරට්ඨ, මධුපාදපතිත්ථ සහ සූකරතිත්ථ)
13. Cv, LXXXI, 1 – 3.
14. Cv, LXXXI, 4 – 9.
15. Cv, LXXXI, 12,13.
16. ලියනගමගේ, 1989: 135
17. Cv.,LXXXI;10 -15.
18. පූජාවලිය, 1968
19. Cv.,LXXXI;17-39,
20. Cv.,LXXXI;40-79,
21. ලියනගමගේ, 1989: 138.
22. ලියනගමගේ, 1989: 139.
23. Cv,LXXXI, 15,16.
24. සුධර්මාවතී, 2016: 53.
25. ගුණවර්ධන,2005: 11.
26. දඹදෙණි අස්න, 1960:31.
27. දඹදෙණි අස්න, 1960:31.
28. සුධර්මාවතී, 2016, 46-66

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

### ප්‍රාථමික මූලාශ්‍රය


දඹදෙණි අස්න, කුවේණි, සිහබා අස්නත්‍රය, මෛත්‍රීපාල මා (සංස්.), ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 1997.

පූජාවලිය, ඤාණවිමල හිමි, කිරිඇල්ලේ. (සංස්), ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1986.

හත්ථවනගල්ල විහාරවංසය, ශ්‍රී සිලක්ඛන්ධ හිමි, ( සංස්). කොළඹ, 1909.

Culavamsa, Wilhelm Geiger (eds.), Part 11, Asian Educational Services, India, 1992.

Mahavamsa, Wilhelm Geiger (eds.), Asian Educational Services, India, 1992.

## නූතන ග්‍රන්ථ

ගුණවර්ධන, ප්‍රිශාන්ත (2004). *දඹදෙණිය හා තදාශ්‍රිත පුරාවිද්‍යා උරුමය*, 10 - 14, වයඹ පුත්‍ර ප්‍රසාදිනී, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය.

ලියනගමගේ, අමරදාස (1989). *මධ්‍යකාලීන ලංකා ඉතිහාසය.* අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.

සුධර්මාවතී ජේ. එම්. (2016), *දඹදෙණිය හා යාපහුව රාජධානි ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්*, සීමාසහිත ඇස් ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම. කොළඹ.

සුධර්මාවතී ජේ. එම්. (2009), *මාඝ ආක්‍රමණය සහ පොළොන්නරුව රාජධානියේ අවනතිය, පුලතිසිවන්සය*, සංස්කෘතික කටයුතු සහ ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය.

Silva, Roland. (2000) *Development of the ancient cities in Sri Lanka*, Reflection on A Heritage, History and Archaeology of Sri Lanka, vol:1, part 1, Central Cultural Fund, Colombo.

Sudharmawathie, J. M., (2003), “The Nature of the kingdoms of Medieval Sri Lanka”, Historical Research, Vol. 1, pp.31 – 52.

Sudharmawathie, J. M., (2009), *The efforts made by the rulers of Dambadeniya to safeguard and protect the scared Tooth Relic of Lord Buddha*, Journal of Social Sciences, Sri Lanka, Quarterly Review, Vol. I, No. 3

Sudharmawathie, J. M. (2017), *Highways in Sri Lanka in the Period of Dambadeniya kingdom*, History of Land Transformation, Locomotive Heritage and Road Culture of South Asia, Center for Heritage Studies, University of Kelaniya, Sri Lanka. (in Sinhala)